**බලංගොඩ ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 13 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 13 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට බලංගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගනන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් සභාව සතු ඉඩම් 13 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | සභාව සතු සියළු ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුල සභාවේ ඉදිකිරීම් හා වැඩි දියුණු කිරීම් සඳහා දරන ලද රු. 3,234,433 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ජංගම නොවන වත්කම් ඉදිකිරීම් හා වැඩිදියුණු කිරීම් ප්‍රාග්ධනිත කළ යුතුවේ. | ජර්නල් සටහනකින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත/ ගබඩා ආරම්භක තොගය රු. 16,830 ක් ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂයේ ආරම්භක ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් මඟින් නිවැරදි කරන බව දන්වමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දැන්වීම් පුවරු ගාස්තු රු. 11,760 ක් ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂයට අදාල ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | ජර්නල් සටහනකින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඉ) | ස්ථාවර තැන්පතු පොලී ආදායම උපචිත පදනම මත ගිණුම්ගත කිරීමට අදාල වන පරිදි ගිණුම්කරණ ප්‍රතිපත්තිය හඳුනාගෙන නොතිබුණි. | උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බැවින් ස්ථාවර තැන්පතු පොලිය ද එම පදනමට ගිණුම්ගත කළ යුතුවේ. | අදහස් දක්වා නොතිබුණි. |

**1.4 අනුකූල නොවීම**

**--------------------**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

**------------------------------------------------------------------------------------------**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) | 24 (1) (අ) හා (ආ) උප වගන්ති | සභාව සතු පාරවල් සහ පටුමාවත්වල සැලැස්මවල් පිළියෙල කිරීමට සහ ඒවායේ නාමලේඛන දැක්වීමට 1974 වර්ෂයේ සිට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සභාව සතු මාර්ග සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |
| (ii) | 154 (1) වගන්තිය | බල ප්‍රදේශය තුල පිහිටි ඉඩමක් කට්ටි කර එකතුව පර්චස් 169 ක් වූ ඉඩම් කට්ටි 06 ක් විකුණා තිබුණද, සභාව වෙත අයවිය යුතු සියයට එකක බද්ද නොගෙවීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කර ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | කට්ටි කර විකුණා ඇති ඉඩම සම්බන්ධයෙන් ඉදිරියේදී සොයා බලා අවශ්‍ය කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව අංක 1533/16 දරන 2008 ජනවාරි 25 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ “ඇ” කොටසේ නියමිත ව්‍යාපෘති සම්බන්ධයෙන් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් නිකුත් කිරීමේදී පළාත් පාලන ආයතනවලට බලතල පවරා දීම හා බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදෙස් මාලාවේ 3.3.1 හා 4.2 උප වගන්ති | 2016 වර්ෂයේ නිකුත් කරන ලද පරිසර ආරක්ෂණ බලපත්‍ර 07 ක වලංගු කාලය අවසන්වී තිබුණද ඒවා නැවත අළුත් කිරීමට හා සමාලෝචිත වර්ෂයේ ආරම්භ කර තිබුණු කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් කිරීමට 2020 මාර්තු වනවිටත් කටයුතු කර නොතිබුණි. | පරිසර බලපත්‍ර ලබා ගතයුතු සියළු ආයතන වෙත නියමිත ක්‍රියාපටිපාටිය අනුව බලපත්‍ර නිකුත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | පරිසර ආරක්ෂණ බලපත්‍ර අළුත්කිරීම සඳහා කටයුතු කරමින් පවතින බවත්, කර්මාන්ත සමීක්ෂණය මේ වනවිට සිදු කරමින් පවතින බවත් දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 371(5) | 1992 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා නිකුත් කර තිබුණු එකතුව රු. 204,535 ක් වූ අතුරු අග්‍රිම 53 ක් 2020 මාර්තු වනවිටත් පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 1992 සිට 2019 දක්වා ඇති රු. 204,535 ක් වූ අත්තිකාරම් කපා හැරීම සඳහා කටයුතු කරමින් පවතින බව දන්වමි. |
| | (ii) මුදල් රෙගුලාසි 571 | කල් ඉකුත් වූ රු. 389,618 ක් වටිනා තැන්පතු 08 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙම තැන්පතු ඉදිරියේදී නියාදනය කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඈ) | 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ගර්හිත තත්වයේ පවතින කැබ් රථයක්, ට්‍රැක්ටර් 05 ක්, ටේලර් 04 ක් සහ ට්‍රැක්ටර් කොටස් 22 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය සම්බන්ධයෙන් පවතින ගැටළු විසඳාගෙන අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | කැබ් රථයේ අයිතිය පළාත් ප්‍රධාන ලේකම් සතු වන අතර, අබලි යන්ත්‍රෝපකරණ වල නීත්‍යානුකූල භාරකාරිත්වය බලංගොඩ ප්‍රාදේශීය ලේකම්වරයා සතු වේ. එම නිලධාරීන්ගේ එකඟතාවය හා උපදෙස් පරිදි ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.1 මාර්ගෝපදේශය | වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය මත ලංසු කැඳවීමකින් තොරව රු. 117,500 ක් වටිනාකමැති කැනපි ටෙන්ට් රෙදි 10 ක් මිලදී ගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නියමිත ක්‍රමය මත ලංසු කැඳවීමෙන් අනතුරුව මිලදී ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,836,324 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 6,220,843 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,938,381 | 1,482,741 | 1,628,657 | 162,195 | 1,723,425 | 1,328,345 | 1,306,730 | 269,540 |
| කුලී | 4,332,200 | 4,592,730 | 4,356,488 | 294,820 | 3,389,750 | 2,691,398 | 2,679,638 | 74,343 |
| බලපත්‍ර ගාස්තු | 558,500 | 619,241 | 722,991 | 98,750 | 507,500 | 643,416 | 620,916 | 141,100 |
| වෙනත් ආදායම් | 15,013,000 | 17,437,709 | 35,692,910 | 24,138,181 | 13,268,000 | 13,431,830 | 7,839,563 | 22,834,342 |
| | 21,842,081 | 24,132,421 | 42,401,046 | 24,693,946 | 18,888,675 | 18,094,989 | 12,446,847 | 23,319,325 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ 02 ත් 15 ත් අතර කාලයක සිට හිඟහිට ඇති රු. 47,721 ක් වූ අක්කර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අක්කර බදු සතොක්ෂණයක් සිදු කරමින් පවතින බවත්, ඒ අනුව ඉදිරියේදී අදාල හිඟ මුදල් අය කිරීමට කටයුතු කරන බවත් දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවත් ඉන් කාරණා 12 ක් සඳහා 2020 මාර්තු වනවිටත් අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදාල අනෙකුත් අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ගැනීමට ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරන බව දන්වමි. |

**(ආ) සන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුළ එකතුවන සන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විධිමත් වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | විධිමත් සන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | දිරන අපද්‍රව්‍ය එකතු කිරීම සඳහා සුදුසු ඉඩමක් සහා බල ප්‍රදේශය තුළ ස්ථාන කිහිපයකම පරීක්ෂා කරන ලද අතර සුදුසු භූමියක් හඳුනා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2012 සිට 2016 දක්වා වූ වර්ෂ වලට අදාලව රු. 963,083 ක් වූ කර්මාන්ත ණය හිමි ශේෂ 15 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ණයහිමි ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මෙම ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

**සේවක පුරප්පාඩු හා අතිරික්ත**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2010 වර්ෂයේ සිට පුරප්පාඩු වී තිබුණු ලේකම් තනතුර සඳහා රාජ්‍ය කළමනාකරණ I ශ්‍රේණියේ නිලධාරිනියක් 2017 වර්ෂයේ සිට වැඩ බැලීම සඳහා පළාත් පාලන කොමසාරිස් විසින් පත්කර තිබුණි. | අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම තනතුර පුරප්පාඩුව පවතින බව කොමසාරිස් කාර්යාලය වෙත කාර්යය මණ්ඩල වාර්තා මඟින් මෙන්ම 2019 ජනවාරි 30 සහ 2019 අප්‍රේල් 03 දිනැති ලිපි මඟින් ද දැනුම් දී ඇති බව දන්වමි. |
| (ආ) | ආදායම් පරීක්ෂක, වැඩ ක්ෂේත්‍ර පරිපාලක, ආයුර්වේද ඖෂධ සංයෝජක, ආදාහනාගාර ක්‍රියාකරු, පුස්තකාලයාධිපති, බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු, සෞඛ්‍ය කම්කරු හා වැඩ ක්ෂේත්‍ර කම්කරු යන තනතුරුවල පවතින පුරප්පාඩු 13 ක් පිරවීමට කටයුතු කර නොතිබීමෙන් අදාල කාර්යය සහ කර්තව්‍යයන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීමට බාධා වී තිබුණි. | තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම තනතුරු පුරප්පාඩුව පවතින බව වාර්ෂික කාර්යය මණ්ඩල වාර්තා මඟින් ප්‍රධාන ලේකම් වෙත හා පළාත් පාලන කොමසාරිස් වෙත දැනුම් දී ඇති බවත්, ප්‍රාදේශීය සභාව මඟින් බඳවා ගත හැකි ප්‍රාථමික තනතුරු සඳහා මැතිවරණ කටයුතු අවසන් වූ වහාම අවශ්‍ය සේවකයන් බඳවා ගැනීමට කටයුතු කරන බවත් දන්වමි. |

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2006 වර්ෂයේ ඉඩම් වෙන්දේසියකින් පොදු කටයුතු සඳහා සභාවට වෙන් කරන ලද පර්චස් 70.37 ක් වූ ඉඩමට අදාල ඔප්පුව ලබා ගෙන අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව සතු වත්කම් වල අයිතිය තහවුරු කරගත යුතුවේ. | මෙම ඉඩමේ ඔප්පුව ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |
| (ආ) පළාත් පාලන කොමසාරිස්ගේ 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන චක්‍රලේඛය ප්‍රකාරව නව තක්සේරුවක් මඟින් වරිපනම් බදු සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වුවද, 2005 වර්ෂයෙන් පසු දේපළ තක්සේරුවක් සිදුකර නොතිබුණි. | වරිපනම් බදු අයකිරීම සඳහා වසර 05 කට වරක් දේපල තක්සේරු කළ යුතුවේ. | වරිපනම් බදු නව තක්සේරුවක් සිදුකර දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව වෙත කිහිපවරක් ලිපි මඟින් ඉල්ලීම් කළ බවත්, ඒ අනුව 2019 නොවැම්බර් මස තක්සේරු ප්‍රතිශෝධන කටයුතු ආරම්භ කළ බවත් දන්වමි. |

### 3.5 වත්කම් කළමනාකරණය

#### 3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු. 61,711,139 ක් වූ වත්කම් විෂයයන් 03 කට අදාලව ස්ථාවර වත්කම් ලේඛනය හා විස්තරාත්මක උපලේඛනද, වටිනාකම රු. 45,576,005 ක් වූ ණයගැති ලේඛනය හා ණයගැති වයස් විශ්ලේෂණය ද යාවත්කාලීන කර නොතිබුණි. | වත්කම් හා ණයගැති ලේඛන යාවත්කාලීනව නඩත්තු කළ යුතුවේ. | ඉදිරියේදී යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව දන්වමි. |

#### 3.5.2 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතු වටිනාකම රු. 5,845,318 ක් වූ ධාවන තත්වයේ පවතින ට්‍රැක්ටර් 02 ක් සහ ගලිබවුසරයක් වර්ෂ 04 කට වැඩි කාලපරිච්ඡේදයක සිට නිෂ්කාර්යව පැවතුණි. | වත්කම් ඵලදායි ලෙස උපයෝජනය කළ යුතුවේ. | ඉදිරියේදී කසළ එකතු කිරීම ආරම්භ කරන තෙක් මෙම රථ රඳවා තබාගෙන ඇති බව දන්වමි. |